# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2346/41 - 2023 අගෝස්තු මස 23 වැනි බදාදා - 2023.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අගෝස්තු මස 08 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.


1A - PG 6458 — 21 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

*කහටගස්දිගිලිය නාගරික බල ප්‍රදේශය*

*I වැනි තීරුව*

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ අංක 231 කහටගස්දිගිලිය නැගෙනහිර, අංක 232 කහටගස්දිගිලිය බටහිර හා අංක 230 මහ මෙස්සලැව යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට අයත් වන්නා වූ කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වෙනි තීරුවේ විස්තර වන ඉම් සලකුණු හා මායිම්වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

*උතුර:*

අංක 201 කොක්මාදුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිමත්, අංක 233 මහකිරිබ්බෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිමත් ඡේදනය වන ආරම්භක ලක්ෂයේ සිට අංක 233 මහකිරිබ්බෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන් කිරිමේදි හමුවන කහටගස්දිගිලිය - රත්මල්ගහවැව - කිවුලේකඩ මාර්ගය ඡේදනය කරමින් තවදුරටත් නැගෙනහිර දිශාවට ගමන් කිරිමේදි අංක 233 මහකිරිබ්බෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිමත් අංක 235 මහගල්කන්දේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිමත් ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට එකී මායිම ඔස්සේ ගිණිකොන හා නැගෙනහිර දිශානුගතව ගමන් කිරීමේදී හමුවන අංක 232 කහටගස්දිගිලිය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හා අංක 231 කහටගස්දිගිලිය නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට අංක 235 මහගල්කන්දේගම ග්‍රා.නි.කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ඊසාන සහ නැගෙනහිර දිශානුගතව ගමන් කරීමේදී හමුවන පුත්තලම - අනුරාධපුර ත්‍රිකුණාමලය මාර්ගය ඡේදනය කරමින් තවදුරටත් නැගෙනහිර දිශානුගතව ගමන් කර අංක 235 මහගල්කන්දේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිමත් අංක 221 මහවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිමත් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද,

*නැගෙනහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 221 මහවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හා අංක 220 කොහොඹගස්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ නිරිත දිශානුගතව ගමන් කිරීමේදී හමුවන අංක 220 කොහොඹගස්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හා අංක 215 දිවිවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද,

*දකුණ :*

අවසන් වරට සඳහන් කරන ලක්ෂ්‍යයේ සිට අංක 215 දිවුල්වැව උතුරු මායිම ඔස්සේ වයඹ දිශානුගතව ගමන් කර අංක 229 දිගන්හල්මිල්ලෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දිශාව දෙසට ගමන් කිරීමේදී හමුවන අංක 229 දිගන්හල්මිල්ලෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හා අංක 198 බෙත්කෑව තුලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද,

*බටහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 198 බෙත්කෑව තුලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කිරීමේදී හමුවන පුත්තලම - අනුරාධපුර - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගය ඡේදනය කර තවදුරටත් එකී මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කිරීමේදී හමුවන අංක 198 බෙත්කෑව තුලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හා අංක 201 කොක්මාදුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට අංක 201 කොක්මාදුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගිණිකොන හා නැගෙනහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කිරීමේදී හමුවන කොක්මාදුව වැව ඡේදනය කරමින් තවදුරටත් උතුරු දිශාවට ගමන් කිරීමේදී හමුවන ආරම්භක ලක්ෂ්‍යය දක්වාද අඳින ලද රේඛාවකින් වටවූ ප්‍රදේශය,

EOG 08-0258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.